

# රශ්මි රාත්‍රිය



## සමග ප්‍රවීණ රංගවේදී සනත් විමලසිරි මෙල්බර්න් නුවරට.

මාර්තු 29 දා 6.00pm රශ්මි රාත්‍රිය
Agora Theatre La- Troba University

අපුරු රංග පෞරුෂයකින් හෙබි මේ අපුරු රංග ශිල්පියා සැබෑ රංග ශිල්පින් අතලොස්ස අතරින් ප්‍රමුඛයෙකි. පසුගිය කාලය පුරා ඔහුගේ විවිධ රංගන කාර්යයන් වේදිකාව ටෙලි නාට්‍ය, චිත්‍රපට මෙන්ම රූපවාහිනී රියැලිටි වැඩසටහන් වලදි මෙන්ම නළු නිළියන් සහභාගී වන රිදී රැයක් වැනි ප්‍රසංග වලදී ද අපට දැකගත හැකිවීය. ලොවින් එකක් එක දෙයකට වෙයි සමත යන වැකිය බොරු කරමින් ඔහු දක්වන දක්‍ෂතා අපමණය. තම දැනුම අනාගත පරපුරට බෙදා දෙමින් නාට්‍ය හා රංග කලාව නම් විෂයය ඉගැන්වීමෙන් ගුරුවරයකු ලෙස කරන සේවයද පැසසිය යුතුය. ඔහු මහරගම ගුරු විද්‍යාල කතිකාචාර්යවරයෙකු ලෙසද සේවය කරමින් තම දැනුම අනාගත ගුරු පරපුරට බෙදා දීමේ කර්තව්‍යයට ද දායක වෙයි.

**ශ්‍රීනාත්**
ඉතින් කොහොමද සනත් මේ දිනවල වැඩ කටයුතු?
**සනත්**
බොහොම හොඳයි. හැබැයි පසුගිය කාලයේ වැඩිපුර විදේශ සංචාර කිහිපයකට සහභාගි වන්න සිදුවීම නිසා බෙහෙවින් කාර්ය බහුල වුණා.

**ශ්‍රීනාත්**
ගායකයෙක් විදියට ද ඔබට විදෙස් සංචාර සඳහා ආරාධනා ලැබුනේ ?
**සනත්**
ගායකයෙක් සහ නිවේදකයෙක් විදියට

**ශ්‍රීනාත්**
නිවේදන ක්ෂේත්‍රයට ඔබ අලුත් නේද?
**සනත්**
කොහෙත්ම නැහැ. මම කලක සිටම නිවේදයෙකු ලෙස කටයුතු කරන අතරම රූපවාහිනී වැඩ සටහන් ඉදිරිපත් කරන්නෙකු ලෙස ද කටයුතු කලා. මේ දිනවල නිවේදන ක්ෂේත්‍රයට ටිකක් ප්‍රමුඛත්වය දෙනව.

**ශ්‍රීනාත්**
නිවේදකයෙක් ද වැඩ සටහන් ඉදිරිපත් කරන්නෙක් ද?
**සනත්**
වැඩසටහන් ඉදිරිපත් කරන්නෙක් කිව්වොත් නිවැරදියි. නිවේදක තනතුරට එහා ගිය එකක් තමයි වැඩසටහන් ඉදිරිපත් කිරීම. බොහෝ ප්‍රේක්ෂකයන් අපෙන් බලාපොරොත්තු වෙන්නේ නිවේදක තනතුරට එහා ගිය දෙයක්. හැම නිවේදකයෙකුටම වැඩසටහන් ඉදිරිපත් කරන්නෙකු වෙවන්න බැහැ.

**ශ්‍රීනාත්**
බොහෝම හරි. මේ දවස් වල විකාශය වන ඔබ රඟපාන ටෙලිනාට්‍ය සහ වේදිකා නාට්‍ය ගැන කතා කලොත්.
**සනත්**
ගිරිකුල, සුරවිමන, චායා, ස්වර්ණමාලි ඊට අමතරව සරච්චන්ද්‍ර ශූරින්ගේ නාට්‍ය විශාල සංඛ්‍යාවක් සමඟ රට වටේ යනවා. ඒ තමයි මනමේ, සිංහබාහු, රජතවලම සහ හස්තිකාන්ත මන්තරේ. ඊට අමතරව ධනංජය කරුණාරත්නගේ ඔබ සාක්ෂයි, ලාස්ට් බස් එකේ කතාව වාගේ නාට්‍ය වල රඟපානවා

**ශ්‍රීනාත්**
මොකක්ද මේ "රශ්මි රාත්‍රිය"
**සනත්**
රශ්මි රාත්‍රිය කියන්නේ මාත් ඕස්ට්‍රේලියාවේ ජිවත් වන ප්‍රවීන රංගන ශිල්පින් කීපදෙනෙක් හා නර්තන ශිල්පීන් කීප දෙනෙක් එකතුව කරන අපුරු රංගන කාර්යයක්

**ශ්‍රීනාත්**
ඒ කියන්නේ මේත් "රිදි රැයක්ද"
**සනත්**




නෑ නෑ ඊට හාත්පසින්ම වෙනස් ප්‍රසංගයක්. මේ ප්‍රසංගයදී අප ඉදිරිපත් කරන්නේ අපේ සංස්කෘතිය සහ අපේ කලා ශිල්ප පෙරදැරි කොටගත් අපුරු ප්‍රසංගයක්. රිදී රැයක් වැනි ප්‍රසංග වල දකින අංග කිහිපයකුත් අඩංගුයි. නමුත් සිංදු වලට නටන නැටුම් ප්‍රසංගයක් නෙවෙයි. මෙයට ඇතුලත් වෙනවා උඩරට පහතරට සබරගමු වැනි නර්තන අංග, නාට්‍ය ගීත සමග නර්තන, හාස්‍යය දනවන නාට්‍ය ජවනිකා, ඒ වගේම මා මෙගා ස්ටාර් ප්‍රසංගයට ඉදිරිපත් කල ආකාරයේ අළුත් ගීත මෙන්ම පැරණි ගීතද මේ ප්‍රකාශයට ඇතුලත්.

මේ ප්‍රසංගයට මෙල්බර්න් නුවර සිටින හැකියාව ඇති වැඩිහිටි තරුණ මෙන්ම ළමා පිරිස් ද රංගනයන් හා නර්තනයන් දායක වනවා.

**ශ්‍රීනාත්**
මේ ඔබේ මෙල්බර්න් නුවර කී වෙනි සංචාරය ද?
**සනත්**
මේ මගේ හත්වැනි සංචාරය. ඇත්තටම මම එන්නේ මේ ප්‍රසංගය සමග නෑගම් ඒමක්

**ශ්‍රීනාත්**
ඒ කිව්වේ ?
**සනත්**
මම මෙල්බර්න් නුවරට කලින් ආ විට ඇති කරගත් යාළු මිත්‍රාදීන් විශාල පිරිසක් මෙහි ඉන්නවා. ඒ වාගේම ඒ අය සමඟ විශාල හිතවත් කමක් මා තුල තියෙනවා. ඉතින් මේ අය හමුවෙලා කතා බහ කරලා ඒ ලෙන්ගතුකම අළුත් කරගත්නත් එක්කයි මම එන්නේ.

**මම ඒ හැමෝගෙන්ම ඉල්ලනවා මාර්තු 29 දා සවස 6.00 ට La-Trobe විශ්ව විද්‍යාලයේ Agora Theater එකට එන්න කියලා අපිත් එක්කක එකතු වෙලා සතුටු වෙන්න.**

**ශ්‍රීනාත්**
ඇයි මේ ප්‍රසංගයට සාම්ප්‍රදායික කලාවන් එකතු කර ගන්නේ?
**සනත්**
ඒකට හේතුව මේකයි. මා දන්නවා පිටරට වල පදිංචි බොහෝ අය එහේ ගතින් සිටියත් සිතින් ජීවත් වන්නේ ලංකාවේ. මා හොඳින් දැක තිබෙනවා බොහෝ විට ලංකාවේ ජිවත් වන අයට වඩා ශ්‍රී ලාංකික සංස්කෘතියට, භාෂාවට, හැදියාවට චාරිත්‍ර වාරිත්‍ර වලට ගරු කරන්නේ අගය කරන්නේ විදේශ වල ජිවත් වන අයයි. ඒ අය නිතරම තම දරුවන්ට කියල දෙන්න උත්සාහ ගන්නේ අපේ දේවල්, අපේ සිරිත් විරිත්. මම ඕස්ට්‍රේලියාවට ආ විට දුටු දෙයක් තමයි එහි පදිංචි ලමුන් කෙතරම් සංස්කෘතික කටයුතු වලට සම්බන්ධ වනවාද කියන එක. දැන් අපේ ලංකාවේ වැඩිහිටියන්ට වදින, ගරුකරන සිරිත් පවා බැහැර වී ගෙනයි යන්නේ. නමුත් විදේශ වල ජිවත් වන අයට උවමනා කරන්නේ අපේ දේ රැක ගන්න. ඔස්කා සංවිධානයට අවශ්‍ය වුයේත් එයයි. ඒ නිසයි සාම්ප්‍රදායික අංග මේ ප්‍රසංගයට ඇතුලත් කළේ.

**ශ්‍රීනාත්**
සන්නස වෙනුවෙන් අපි ඔබට සුබපතනවා ඔබේ මෙල්බර්න් ප්‍රසංගය අති සාර්ථක ප්‍රසංගයක් වේවා කියල
**සනත්**
ඒ වගේම කියන්න ඕන මේ ප්‍රසංගයට මට විශේෂ අමුත්තා විදියට ආරාධනා කළේ මෙල්බර්න් හි 'මීජ් සංවිධානය එහි නිලධාරින් ඇතුළු සාමාජිකයන්ට මාගේ පූර්ණ ස්තුතිය පුද කරනවා. ඔවුන්ට අවශ්‍ය වී තිබෙන්නේ සිංහල අළුත් අවුරුදු උදාවත් මුල් කරගෙන සංස්කෘතික අංග රැසක් ඇතුලත් හොඳ ප්‍රසංගයක් ඉදිරිපත් කරන්නයි. මේ සඳහා මාවම තෝරා ගැනීමේ විශේෂ හේතුව තමයි මගේ රංගන හා ගායන හැකියාව මෙන්ම සාම්ප්‍රදායික නර්තනය හා බෙර වාදනය පිළිබඳ මට ඇති හැකියාව. ඒ වගේම ගුරුවරයෙකු ලෙස සේවය කිරිමත් ඔවුන්ගේ ආරාධනාවට හේතු වු බවයි සංවිධායක මඩුල්ල මට දැනුම් දුන්නේ.

**ශ්‍රීනාත්**
මාර්තු 29 දා රශ්මි රාත්‍රියේදී අළුත්ම අත්දැකීමක් විඳගන්න මෙල්බන් ඔබ සැමට අවස්ථාව ලැබේවි. ඊට අපෙන් සුබ පැතුම්.

**VCE Excellence –Since 1998**

**Affordable Private Tutoring for VCE Year 11 & 12 PHYSICS (2014/2015)**

10% OFF all group classes when you show this ad

***Small group class for students from Melbourne High School.***
*Physics Unit 1&2 – Saturday 3.30pm, to commence on 23rd November at ecoBright Learning Centre, Tullamarine. Register your interests now as only limited places are available.*

**Email:**
**vce.excellence@gmail.com**
**Or ring Wasantha or Sumudu Perera on 03 93351595(all hrs)**

***Face the challenges of VCE with the best learning strategies and achieve A+ results!***

*Hurry! Very limited places available for Individual tutoring for students in North & North West of Melbourne.*

***CLOSING THE GAP****- A Special Physics and Science Foundation Course to prepare students for the VCE Year 11 Physics. Affordable 3 weeks(6 hours) group class to commence from 23rd Nov at Tullamarine.*

***GAMSAT Science Preparation** Classes over 3 weeks in December 2013 at ecoBright Learning Centre, Tullamarine. Email us for more details….*